# නඩරාජාට මෙන් තිස්සට ද වැරදුනි

**මට ඇති කාණගාටුව නම් තිස්සට මෙම දඬුවම ලැබෙන්නේ එක්තරා සමාජ අනුමැතියක් ද සහිතව වීම ගැනයි. තිස්ස රිමාන්ඩ් බාරයට පත්වූ දා සිට ඔහු හිරගෙට යැවූ අගෝස්තු 31 වනදා දක්වා මම ඒ ගැන උනන්දුවෙන් පසුවීමි. ඔහු ගැන කථා කරන්නට සිය ගණනක් වූ පත්තර අතර ඉදිරිපත් වූයේ කීයද? විකල්ප වෙබ් අඩවි රාවය වැනි පුවත් පත් පමණක් ඒ යුතුකම ඉෂ්ඨ කලේය.**

සියල්ල අවසානයේ තිස්සනායගම් සිරගෙට යැවුණි. මඳ කලකට නොව වසර විස්සකටය. පුවත් පලකිරීමේ නිදහස වෙනුවෙන් 1871 දී සිරගෙට යැවුණු පැලිස් අප්පුහාමිගේ සිට මේ තාක්කල් පුවත්පත් කලාව වෙනුවෙන් ඉහලින්ම වන්දි ගෙවූයේ තිස්සනායගම් යැයි ඉතිහාසය යළි යළිත්, කාලාන්තරයක් යනතුරු අපට මතක් කර දෙනු ඇත. ලසන්ත වික්‍රමතුංග වැනි කිහිප දෙනෙක් සිය ජීවිතයෙන් වන්දි ගෙව්වා සැබෑ වුවත් ඊටත් වඩා තිස්සනායගම් ගෙවන වන්දියේ හරයාත්මක වටිනාකම ඉහළ යයි මම සිතමි. ලසන්තගේ මාධ්‍ය ක්‍රියාකාරිත්වය පුවත්පත් කලාවේ සීමාවන් අබිභවා ඔහු සේවයකළ පක්ෂයේ අභිලාෂයන් හා සම්බන්ධ කළේය. එහෙත් තිස්සනායගම්ගේ පුවත්පත් රචනාවන් බද්ධ වූයේ එවන් පටු අරමුණු සඳහා නොව තම හෘද සාක්ෂියටය.

අධිකරණයට ගරු කරන්නට අපට බල කර තිබේ. එය සැම රටක්ම සිය රටවැසියන්ට ලබාදෙන මූලික නෛතික නියෝග යකි. හෘද සාක්ෂිය ක්‍රියාත්මක වන්නේ ඊට පරිබාහිරින් වුවද නියෝගය පිළිපැදිය යුතුය. බ්‍රිතාන්‍යයේ හෝ කැනඩාවේ වේවා, චීනයේ හෝ කියුබාවේ වේවා සිම්බාබ්වේ හෝ රුවන්ඩාවේ වේවා ඒ ඒ රටවල දේශපාලන යාන්ත්‍රණය සිය රටවැසියන්ට ඒ නියෝගය ලබා දෙනු ලැබේ. එය පිළිපැදිය යුතුය. එහෙත් ඇත්ත නම් බ්‍රිතාන්‍යයේ හෝ කැනඩාවේ අධිකරණය හා සිම්බාබ්වේ හෝ රුවන්ඩාවේ අධිකරණ ක්‍රියාකාරිත්වය තුළ යුක්තියේ හා සාධාරණත්වයේ ප්‍රමාණය අහසට පොළොව මෙන් දුරස්ථ බවයි.

ජාතික වාදය ඇතුලු අනේක විධ විෂබීජ වලින් බොරවී ඇති අද ලාංකීය සමාජය තිස්සනායගම්ට දුන් දඬුවම අප ගෙවා දමන යුගයේ අධිකරණමය නිරූපනයයි. එහෙත් මීට වඩා ප්‍රජාතන්ත්‍රවාදයක් ක්‍රියාත්මක වූ හැටේ දශකයේ දී තිස්සනායගම් මේ ලිවීමම කළා නම් ඔහුට දඬුවමක් නොලැබෙන්නටද ඉඩ තිබිණි.

මට ඇති කාණගාටුව නම් තිස්සට මෙම දඬුවම ලැබෙන්නේ එක්තරා සමාජ අනුමැතියක් ද සහිතව වීම ගැනයි. තිස්ස රිමාන්ඩ් බාරයට පත්වූ දා සිට ඔහු හිරගෙට යැවූ අගෝස්තු 31 වනදා දක්වා මම ඒ ගැන උනන්දුවෙන් පසුවීමි. ඔහු ගැන කථා කරන්නට සිය ගණනක් වූ පත්තර අතර ඉදිරිපත් වූයේ කීයද? විකල්ප වෙබ් අඩවි රාවය වැනි පුවත් පත් පමණක් ඒ යුතුකම ඉෂ්ඨ කලේය. පාර්ලිමේන්තුවේ විපක්ෂයට ඔහු ගැන පෙනී සිටින්නට බරපතල යුතුකමක් තිබිණි. එහෙත් ඔවුන් අතින් කිසිවක් සිදු නොවුණි. ඇමරිකානු ජනාධිපති බරක් ඔබාමාට තිබූ වුවමනාවවත් තිස්ස ගැන විපක්ෂයට නොතිබුණි.

කියවන නුවණ 96% ක් වෙතත් ජනතාව තීරණ ගන්නේ සිය ඉව හා තදාසන්න හේතු කාරණා ආශ්‍රයෙනි. පොදු ජනතාවට යුද්ධය හමාරවීමෙන් ලැබුණු සහනය අසීමිතව භුක්ති විඳින තත්වයක් යටතේ ඒ යුද ග්‍රහණය ලබාදුන් පාර්ෂවය තිස්සනායගම් ත්‍රස්ත වාදියෙකු යැයි කියන විට ජනතාවට ඒ මතය බොරු යයි කිව නොහැකිය. එහෙත් කාරණා ඇසුරෙන් තීන්දු ගන්නා මාධ්‍යවලට එසේ ක්‍රියා කළ හැකිද?

අගෝස්තු 31 වනදා දිවයින පුවත්පත තිස්ස නායගම් සිරගෙට යැවූ පුවත වාර්තා කළේ "ත්‍රස්තවාදය වැළක් වීමේ නීතිය යටතේ අධි චෝදනා ලබා සිටි මාධ්‍යවේදියකු බව කියන ජේ. එස්. තිස්සනායගම් නැමති අයට......' වශයෙනි. තම මාධ්‍ය සගයකුගේ ඉරණම තීන්දු කෙරෙන බේදවාචී මොහොතේ ඒ මිනිසා මාධ්‍යවේදියකු ලෙස පිළිගන්වන්නටවත් පුවත්පත් සූදානම් වූයේ නැත.

තිස්ස පිළිබඳ ඔහුගේ මිතුරන් හා ඇසුරු කළවුන් දන්නා දෙය තිස්සට දඬුවම් කළ උදවිය දන්නේ නැත. තිස්ස කොළඹ විශ්ව විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා සිංහල දූන උගත් සමාජය ඇසුරු කළ තරුණ බුද්ධිමතෙකි. ඔහුට හොඳින් සිංහලත්, ඉංගිරිසිත් දෙමළත් හැසිරවිය හැකිව තිබිණ. 1987 - 94 කාලයේ ඔහු අප සමග එකට මාර්ග ආයතනයේ තරුණ පර්යේෂකයන් ලෙස සේවය කළෙමු. මා දන්නා තිස්ස නම් අපමණ දැනුම පිපාසයකින් පෙලුණු, පුළුල් ගවේෂණශීලී මනසක් සහිත සමාජ සංවේදී මිනිසෙකි. එල්.ටී.ටී.ඊ. ය හා ජනතා විමුක්ති පෙරමුණ ද ඇතුළු සන්නද්ධ ව්‍යාපාර කෙරේ ඔහුට තිබුණේ බලවත් විවේචනයකි.

තිස්ස දේශපාලන පරමාදර්ශය පැතූ පුද්ගලයකු වූ නිසා කිසිදු දේශපාලන පක්ෂයකට හෝ ව්‍යාපාරයකට ඔහු අවනත කරගත නොහැකි විය. තමන් සේවය කළ ආයතනයේ වැටුප් අරගලයකට නායකත්වය දුන් තිස්ස වාසුදේව නානායක්කාරගේ අනුග්‍රහයෙන් වෘත්තිය සමිතියක් නිර්මාණය කර ගැනීමට දායක විය. 1994 මා එම ආයතනයෙන් ඉවත්ව ගොස් රජයේ සේවයට එක්වීමි. පසුව තිස්ස එම ආයතනයෙන් දොට්ට වැටුණු බව මා ආරංචි විය.

තිස්සට පුවත්පත් කලාව හැර වෙනත් වෘත්තියක් තෝරා ගැනීමට හා ගෞරවාන්විතව රට හැර යාමට අවශ්‍ය උසස්ම සුදුසුකම් තිබුණි. එහෙත් තිස්ස තෝරාගත්තේ ඔහු ඉදිරියේ තිබුණු දුෂ්කරම මාවතයි. සරුංගලය චිත්‍රපටයේ නඩරාජා මෙන් ඔහු තමාගෙ වෘත්තිය හිතවතුන් සමඟ ජීවත්වීම මැනවයි සිතන්නට ඇත. එහෙත් නඩරාජාට මෙන් තිස්සට ද වැරදුනි.

සිංහලයන්ට සිංහලකමට ලෙන්ගතුවීමට ඇති අයිතිය තමාගේ දෙමළ කමටත් ලැබේයයි ඔහු සිතන්නට ඇත. ඔහු සමග එකම ආයතනයක වැඩ කරද්දී විවෘතව, හෘදය සාක්ෂියට එකඟව වැඩ කිරීමට ඇති කැමැත්ත මැනවින් ප්‍රදර්ශනය විය. සරුංගලේ චිත්‍රපටයේ නඩරාජාට මෙන් තිස්සට ද තමා අවට ඇති භයංකාරත්වයේ තරම ගැන එදා ඔහුට වැටහීමක් තිබුනේ නැත. වසර 15 කින් පමණ මුණ නොගැසුණු මගේ මිතුරාට අදද ඒ වැටහීම ලැබී නැත යන්න ඔහුට අත්පත් වූ විපත්තියෙන් පෙනේ.

එදා ප්‍රංශයේ ඩිගෝල් ජනාධිපතිවරයා තමන් විසින් කරගෙන යන ඇල්ජීරියානු අරගල මර්ධන මෙහෙයුමට එරෙහිව ක්‍රියාකාරි වූ ජීන් පෝල් සාත්‍රේ ගැන කිසිවක් නොකරන්නේ මන්දැයි කිසිවකු ඩිගෝල්ගෙන් ඇසීය. එය කෙසේ කළ හැකිද? සාත්‍රේ යනු ප්‍රංශය යයි ඩිගෝල් උත්තර දුනි.

තිස්සනායගම් යනු සාත්‍රේ නොවන බව සැබෑය. එහෙත් සාත්‍රේ භුක්ති වින්දේත්, තිස්ස භුක්ති විඳින්නට උත්සාහ කළේත් එකම මානව වර්ගයක අවිහිංසාවාදී ප්‍රමුඛ ක්‍රියාකාරිකයකුට තිබිය යුතුයයි විශ්වාස කළ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසයි. එදා ඩිගෝල්ගේ ක්‍රියාකලාපය නිසා ඩිගෝල් සහ ජීන් පෝල් සාත්‍රේ දෙදෙනාම සම්භාවනාවට පත්විය. එහෙත් අපේ රටේ තිස්ස සිර ගෙයට නියම විය.

තමන් ලියූ සටහනක් නිසා පාර්ලිමේන්තුවට ගෙන්වා නඩු අසා දඬුවමට ලක්වූ එවක ඔබ්සවර් කතෘ හැරල්ඩ් පීරිස්ගේ කතාව තිස්සනායගම්ගේ සිද්ධියට වඩා බෙහෙවින් සුළුය. එහෙත් දශක ගණනාවක් පුරා එය පුරාවෘත්තයක් මෙන් මාධ්‍යවේදීන් හා විද්වතුන් අතරේ රැව් දුන්නේ ඒ දඬුවම් පැනවූ පාලකයන්ට විරුද්ධව පිළිකුල් සහගත මතයක් ගොඩ නංවමිනි.

තිස්සනායගම් උදෙසා ඒ මතය ඊට වඩා ප්‍රබල විය හැකිය. දැනටමත් ඔහුට "රිපෝටර්ස් විතවුට් බෝඩර්ස්" ආයතනය වසරේ මාධ්‍ය වේදියා යන ප්‍රදානය හිමිකර දී තිබේ.

ශ්‍රී ලංකාව අද සිටින්නේ පාලකයනට අවශ්‍ය නම් පොදු යහපත තකා සියල්ල එදෙසට දිසානති කර ගත හැකි අවධියකය. නිදහසින් පසු මෙවන් ස්වර්ණමය අවස්ථාවක් පාලකයකුට නොලැබුණු තරම්ය. එහෙත් මාධ්‍ය මර්ධනය වැනි අකටයුතුකම් හා මූලධර්මීය මාවතකට රාජ්‍ය ගමන් කරවීමට දක්වන කැමැත්ත විසින් සමාජය දිගු කාලීනව අවුල් ජාලාවක් වීම වැළැක්විය නොහැකි වනු ඇත.

චන්ද්‍රරත්න බණ්ඩාර
-කැනඩාව-
ලංකා ඊනිව්ස් අනුග්‍රහයෙන්

12 වන පිටුවෙන් (ඉස්කෝල )

මං ඉන්නම් - නුඹ එනකල්

මානික්කම් !

දයාලන්ලාගෙන්, මානික්කම්ලාගෙන් සංවේදී වුණ සිතුවිලි වලින් හෝ අපට අපගේ මිනිස්කම් පිළිබඳව සංවේදී විය හැකි වේ නම් කෙතරම් සුන්දර වේ ද මේ මනුසක්වල? ප්‍රශ්නාර්ථයකින් ලියවිල්ල හමාර කලා.

තමුන්නැහේගෙන්

වැරැද්ද - සිංහලෙන්

ටයිප් කරන්න ඉගෙන ගත්තනං කාටවත් කරදරයක් නෑනේ......!

කුරුටු ගෑවිල්ල අහවර කරපු පන්ට පන් කිව්වා.

"එක තමයි උදේ පාන්දරම ටොක්කක් ඇණ ගත්තේ......"

පන් නැගිටලා යන්න ගියේ ලැජ්ජාවෙන් වගේ.

## "මාරිම්බා නයිට්"

## බ්‍රිස්බේන් නුවරදී

විශාරද රෝහණ ධර්මකීර්ති සහ ප්‍රවීණ වාද්‍ය-ශිල්පී හේමතිලක ගාල්ලගේ යන අයගෙ සහභාගීත්වයෙන් සැප්තැම්බර් 12 වන දා බ්‍රිස්බේන් නුවර Clairvaux Mackillop Collage (ක්ලෙයාවෝ මැකිලොප් කොලේජ්) හිදී පව 700ට "මාරිම්බා නයිට්" සංගීත ප්‍රසංගය වේදිකාගත වෙයි

මෙහිදී සංගීත අධ්‍යක්ෂණයෙන් හා මධුර වයලීන වාදනයන්ගෙන් විශාරද රෝහණ ධර්මකීර්ති දායක වන අතර ගාල්ලගේ වාද්‍ය ශිල්පියාගේ අපූරු වාදනයද ඊට මුසුවනු ඇත හැත්තෑව දශකයේ ජනප්‍රිය ගීතවලින් බ්‍රිස්බේන් නුවරවාසී ශිල්පී ශිල්පිනියන් රසිකයින් පිනවීමට නියමිතයි

ආරාධිත ශිල්පී දෙපල වෙනුවෙන් අනුග්‍රහය දක්වන්නේ මෙල්බර්න් නුවර දොස්තර රංජිත් හෙට්ටිආරච්චි සහා පුෂ්පා හෙට්ටිආරච්චි දෙපළයි

විමසීම් සඳහා අමතන්න : උපමාලිකා කරුණාසේන 0421752103